# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2062/36 – 2018 මාර්තු 16 වැනි සිකුරාදා – 2018.03.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ මාපලාන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/කේඑම්බී/2017/43 හා 2017.08.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.8525ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගිරාගහහේනවත්ත – ප්‍රමාණය: හෙක්. 1.8525**

උතුරට සහ නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව); දකුණට සහ බටහිරට: ඇළ.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2016/ඒ/463.
2017 නොවැම්බර් මස 27 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 1329

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශ්‍යතාවය, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශ්‍යතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශ්‍යතාවේ විස්තරය.–** හෝකන්දර ජල සම්පාදන ක්‍රමයේ කාණු පද්ධතිය පිළිසකර කිරීම සඳහා ඉඩම් කොටසක පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.–** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හෝකන්දර උතුර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/කේඩීඩබ්ලිව්/2014/243 හා 2014.07.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අංක 1 ලෙස දක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.0016 ක් පමණ වන ඇළ ඉඩම නමැති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 1 – ඇළ ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0016 ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: ඇළ සහ ඩබ්. ඇල්බට් පෙරේරා හිමිකම් කියන ඉඩමේ නම සොයාගත නොහැකි ඕවිට; දකුණට: මාර්ගය; බටහිරට: ප්‍රේමරත්න පතිරණ සහ ඒ. කේ. සී. පද්මලතා හිමිකම් කියන ගුරුගේ වත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2006/ඩබ්ලිව්එස්/329.
2017 දෙසැම්බර් මස 11 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 1330

1A – G 27302 – 17 (2018/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.